ඇඹිලිපිටිය නගර සභාව

රත්නපුර දිස්ත්‍රික්කය

01. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 16 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 මැයි 23 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේදී ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම ගැලපීමේදී එම වටිනාකම රු. 34,400 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පල්ලේගම බස් නැවතුම්පල තාවකාලික කඩකාමර සඳහා කුලී, සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු. 1,542,800 ක හිඟයක් පවතින නමුත්, එම වටිනාකම පසුගිය වර්ෂයේදී හඳුනාගෙන ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂයේ හිඟය ගලපා ගිණුම තුලනය කිරීමෙන් ගිණුමේ ශේෂය වන රු.1,888,900 ක් ලැබිය යුතු ආදායම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව ලැබිය යුතු ආදායම් රු. 346,100 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ රු. 20,050,000 ක්වූ වාහන, පරිත්‍යාග සංචිතයක් ලෙස ගිණුම්ගත කල යුතු වුවත්, එම වටිනාකම ප්‍රාග්ධන යෙදුමට ආදයමින් දායක වීමේ ගිණුමට බැර කර තිබුණි.

(ඈ) දේශීය ණය හා සංවර්ධන අරමුදල මඟින් ඉදිරිපත් කරන ලද ශේෂ සනාථන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ණය ශේෂය රු. 19,069,621 ක් වුවත්, ලෙජර් ගිණුම අනුව එකී ශේෂය රු. 18,560,436 ක් වූයෙන් බාහිර වගකීම් රු. 509,185 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ)(i) පල්ලේගම පොදු වෙළඳපල කඩකාමර කුලී 2014 දෙසැම්බර් 31 දිනට රු. 930,800 ක හිඟ ශේෂයක් පැවති නමුත් එය එම වර්ෂයේ ගිණුම් වල ආරම්භක ශේෂය වශයෙන් දක්වා නොමැති අතර, සමාලෝචිත වර්ෂයේ එම ගිණුම තුලනය කර ශේෂය වන රු. 553,900 ක් පමණක් ජ'නල් සටහන් අංක 34 මඟින් ගැලපීම් කර තිබුණි. තවදුරටත් රු. 376,900 ක් ආරම්භක හිඟ ශේෂයක් වශයෙන් ගැලපිය යුතුව තිබූ අතර ඒ අනුව එම ප්‍රමාණයෙන් අඩුවෙන් ජංගම වත්කම් ගිණුම්ගත කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා නවනගර වෙළඳපල කඩකාමර සඳහා බිල්කල ආදායම රු. 757,600 ක් වියයුතු වුවත්, පොදු වෙළඳපල කඩකාමර සඳහා වන ලෙජර් ගිණුම තුලනය කිරීමෙන් ලද වෙනස වූ රු. 878,340 ක් නවනගරය වෙළඳපල කඩකාමර බිල්කල ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ බිල්කල ආදායම රු. 120,740 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුල රැස්කල කලින් ලද වරිපනම් බදු වටිනාකම වරිපනම් ලේඛණය අනුව රු. 155,713 ක් වුවත්, එය මූල්‍ය ප්‍රකාශන මඟින් රු. 30,664 ක් ලෙස දක්වා තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 125,049 ක් වැඩියෙන් දක්වා ඇති අතර, එම ප්‍රමාණයෙන්ම වගකීම් ශේෂය අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 06 කට අදාලව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ සහ උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ වෙනස රු. 541,447 ක් විය.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

නගර සභා කොන්ත්‍රාත් 06 ක් ඉටු කිරීම සඳහා සහ කුට්ටිගල් තත්ත්ව පරීක්ෂාවක් සිදුකිරීම සඳහා 2010 හා 2013 වර්ෂයන්හීදී රු. 721,567 ක අත්තිකාරම් ලබාදී තිබූ නමුත් විගණිත දිනය වූ 2015 නොවැම්බර් 26 දින වනවිටත් අදාල අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.4 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම් |
|---|---|
| (අ) නගර සභා ආඥා පනත (255 අධිකාරය) | |
| වගන්ති අංක 159(ඊ) | නාගරික පිළිගැනීම් හෝ පොදු යහපතට හෝ යම් ආගමික, පුණ්‍යාධාර, සංස්කෘතික, සෞඛ්‍ය, විනෝදාත්මක හෝ අධ්‍යාපනික සිද්ධීන් සම්බන්ධව අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව සභාව විසින් වියදම් දැරිය යුතු වුවත්, එවැනි අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ දී රු.95,000 ක වියදම් දරා තිබුණි. |

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ

| | |
|---|---|
| 2012 මැයි 29 දිනැති අංක 03/2012 දරණ චක්‍රලේඛය. | මහජන නියෝජිතයින් සඳහා ඉන්ධන දීමනා ගෙවීමේදී පළමුව අත්තිකාරම් ලබාදී පසුව එය ප්‍රතිපූර්ණය කර ගැනීමේ පදනම මත ගෙවිය යුතු වුවත්, ඉදිරිපත් කරනු ලබන බිල්පත් මත පදනම්ව ඉන්ධන දීමනාව ගෙවා තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි අංක 317 (2) | දෙන ලද කාර්යය නිමකළ විගස අත්තිකාරම් පියවිය යුතු වුවත්, 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා එකතුව රු.1,122,292 ක අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. |

02. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 25,367,723 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 21,178,284 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
-------------------------------------

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 4,189,439 කින් වැඩිවී තිබූ අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 20 ක වැඩිවීමක් බව නිරීක්ෂණය විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම් වල වැඩිවීම හා පුනරාවර්තන වියදම් වල අඩුවීමයි.

2.3 ආදායම් පරිපාලනය
-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්
-------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 18,195 | 17,883 | 31,630 |
| බදු කුලී | 10,867 | 13,033 | 3,611 |
| බලපත්‍ර ගාස්තු | 3,496 | 1,513 | 1,256 |
| වෙනත් ආදායම් | 38,446 | 36,956 | 1,490 |

2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

-----------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු සහ වෙනත් ආදායම් යන ආදායම් විෂයයන් රැස්කල ආදායම, අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 17, සියයට 57, සියයට 22, හා සියයට 11 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.3.3 වරිපනම් බදු

--------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාව අයවිය යුතු හිඟ වරිපනම් බදු මුදල රු. 31,630,167 ක්වූ අතර, හිඟ වරිපනම් බදු ශේෂය වාර්ෂිකව වැඩිවන තත්ත්වයක් නිරීක්ෂණය විය. පවතින පරිගණක පද්ධතියේ ගැටළු හේතුවෙන් හිඟ වරිපනම් බදු වටිනාකම සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් ලබා ගැනීමට අපහසු තත්ත්වයක් පැනනැගී තිබුණි.

2.3.4 වෙනත් ආදායම්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කල ආයතන 27 කින් රු. 346,148 ක ආදායමක් ලබාගෙන තිබූ අතර, අදාල පාර්ශව සභාවට පැමිණ සිදු කරන ගෙවීම් අයකර ගැනීමෙන් ඔබ්බට එම ගාස්තු අයකර ගැනීම උදෙසා සුදුසු වැඩපිළිවෙලක් හෝ අනවසර දැන්වීම් පුවරු ඉවත් කිරීම සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙලක් සභාව ක්‍රියාවට නංවා නොතිබුණි.

(ආ) පල්ලේගම බස් නැවතුම්පල ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කර නොතිබුණි. 2014 හා 2015 වර්ෂයන් සඳහා මෙම අය මාර්ගයෙන් කිසිඳු ආදායමක් සභාවට ලැබී නොතිබූ අතර, සභාවේ නිලධාරියෙකු යොදවා හෝ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සමඟ ඍජු සම්බන්ධතා ගොඩනගා ගෙන එම ගාස්තු අයකර ගැනීම උදෙසා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී බදු දී තිබූ නවනගර සතිපොල, පල්ලේගම අංක 03 කඩකාමරය සහ රථ වාහන නවතා තැබීමේ ගාස්තු යන ආදායම් මාර්ග 03 ක බදුකරුවන් අදාල බදු ගිවිසුමෙන් ඉවත්වීම මත ගිවිසුම් අවලංගු කර තිබූ නමුත් නැවත ටෙන්ඩර් කර බදු දීමට කටයුතු නොකිරීමෙන් 2015 ඔක්තෝබර් 31 දින වනවිට රු. 1,363,321 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ඈ) පල්ලේගම පොදු වෙළඳපල කඩකාමර 12 කින් හා පල්ලේගම බස් නැවතුම්පල තාවකාලික කඩකාමර 37 කින් 2015 නොවැම්බර් 27 දින වනවිට පිළිවෙලින් රු. 358,700 ක් හා රු. 2,732,300 ක බදු මුදල් අය වීමට තිබූ අතර, කඩකාමර බදු ලබාදීම සම්බන්ධයෙන් බදු ගිවිසුමක්ද ඇති කරගෙන නොතිබුණි.

2.3.5 නව වෙළඳපොල කඩ කාමර බදු දීම

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් පාලන කොමසාරිස්ගේ 2009 මාර්තු 09 දිනැති අංක 2009/01 දරන චක්‍රලේඛය මගින් පැරණි වෙළඳපල ගොඩනැගිල්ලක් ඉවත් කර නව වෙළඳපලක් ඉදිකර ඇති අවස්ථාවකදී එකී කඩකාමර බදුදීම සඳහා පෙර ගෙවුම් මුදල තීරණය කල යුතු ආකාරය දක්වා තිබියදී පැරණි වෙළඳපල ඉවත් කර ඉදිකරන ලද නවනගර පොදු වෙළඳපලේ ස්ථිර කඩකාමර 30 ක අවම ප්‍රදාන මුදල ලෙස රු. 100,000 ක් පැරණි කඩහිමියන් විසින් ගෙවිය යුතු බවට සභාව මගින් තීරණය කර තිබුණි. මේ අනුව එකී කඩකාමර සඳහා

2015 අප්‍රේල් 06 දිනැති ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත අවම පෙරගෙවුම් මුදල තීරණය වීමට අවස්ථාව නොතබා අවම පෙරගෙවුම් මුදල සභාව මඟින් තීරණය කිරීම තුල සභාවට රු. 8,232,000 ක අලාභයක් සිදුව තිබුණි.

(ආ) යථෝක්ත කඩකාමර අතරින් කඩකාමර 26 ක බදුකරුවන් සභාව සමඟ ගිවිසුමකට එළඹ නොමැති බවත්, එකී කඩකාමර 26 අතරින් කඩකාමර 11 ක් සඳහා පමණක් 2015 වර්ෂය සඳහා මාසික කුලී මුදල් ගෙවා තිබූ බවත්, කඩකාමර අංක 12 හා 13 සඳහා හිමිකම්පෑමට පැරණි වෙළඳපල කඩකාමර හිමියන් කිසිවෙකු ඉදිරිපත් වී නොමැති බවත් නිරීක්ෂණය විය. මේ අනුව ගිවිසුම්ගත නොවූ හා මාසික කුලී මුදල් නොගෙවන එකී කඩකාමර වල වෙළඳාම පවත්වාගෙන යන්නේද යන්න පිළිබඳව හෝ කිසිඳු තොරතුරක් විගණනය වෙත අනාවරණය නොවූ අතර, මාසික කුලී මුදල් නොගෙවන හෝ වෙළඳාම පවත්වාගෙන නොයන හෝ පැරණි කඩහිමියන් විසින් ලබා නොගන්නා ලද කඩකාමර නැවත ටෙන්ඩර් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 මැයි 01 සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණය වෙතින් ලැබිය යුතු උසාවි දඩ මුදල් රු. 1,550,271 කට අදාල උසාවි දඩ මුදල් උප ලේඛණ ගෙන්වා ගෙන තිබුණද, එම මුදල් අයකර ගැනීමේ ප්‍රමාදයක් දක්නට තිබුණි.

(ආ) 2014 අප්‍රේල් 01 සිට 2015 මාර්තු 31 දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 1,695,437 කට අදාල මුද්දර ගාස්තු උප ලේඛණ ලැබී තිබුණද, එම මුදල් පළාත් සභාව මඟින් ගෙවීමේ ප්‍රමාදයක් දක්නට තිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අදාලව සමීක්ෂණ මණ්ඩල නිර්දේශ නියමිත පරිදි ක්‍රියාත්මක කර නොතිබූ අතර, පසුගිය වර්ෂ කිහිපයකම භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2015 නොවැම්බර් 27 දින වනවිටද සේවයෙන් ඉවත්වූ නිලධාරීන් 04 දෙනෙකුගේ හා ස්ථාන මාරුවීගිය නිලධාරී 04 දෙනෙකුගේ සේවක ඇප රු. 42,292 ක් අදාල නිලධාරීන් සම්බන්ධයෙන් යම් බැඳීමක් පවතී නම් එම බැඳීම් පියවා ගැනීමෙන් අනතුරුව අදාල ඇප මුදල් නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නවනගර සතිපොල බදු ලබාගත් බදුකරුගෙන් 2015 අප්‍රේල් මාසය සඳහා වු මාසික කුලී මුදල් ලෙස රු. 684,012 ක් 2015 සැප්තැම්බර් 10 දින තැන්පත් මුදල් මඟින් හිලව් කරගෙන ඉතිරි තැන්පත් මුදල් රු.1,000,000 ක් ආපසු ගෙවා තිබුණි. නමුත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් එකතු කළ අගය මත බදු වලින් සභාව නිදහස් කිරීම හේතුවෙන් නියමිත කාල සීමාව තුල අදාල එකතු කළ අගය මත බදු මුදල වූ රු. 55,001 ක් හිලව් කිරීමට කටයුතු කර නොතිබුණි. නමුත් අදාල කාල සීමාව තුලදීම එකී බදු මුදල් අය කර ගැනීමට කටයුතු නොකිරීමෙන් ආපසු ගෙවන ලද එකතු කළ අගය මත බදු මුදල වූ රු. 55,001 ක් රජයට සිදුවූ පාඩුවක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) සභාවේ එක් එක් වාහන සම්බන්ධයෙන් වගකීම වාහනයේ ඉන්වෙන්ට්‍රිය සමඟ විධිමත් පරිදි ලිඛිතව රියදුරු හට පවරා නොමැති බවත්, සභාවේ වාහන වල සවි කර තිබූ හෝ නැතහොත් පසුව සවි කරන ලද

අමතර උපාංග හා උපකරණ සම්බන්ධයෙන් ප්‍රමාණවත් විස්තර අඩංගු ලේඛණයක් හෝ වාහන ඉන්වෙන්ට්‍රියක් නඩත්තු කර නොතිබුණි. තවද, සභාව සතු විධිමත්ව පවරා නොගත් වාහන 05 කට අදාල ලියාපදිංචි සහතික ආදිය සභාව සතුව නොමැති බවත් විගණනයේදී අනාවරණය විය.

(ඉ) නගරයේ කාණු පද්ධතිය වෙනුවෙන් දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් 2012 වර්ෂයේදී ලබාගත් රු. 10,435,506 ක්වූ ණය මුදල් එකී වර්ෂ වල සිටම ගෙවීම් පැහැරහැර තිබුණි. මේ අනුව පැහැරහරින ලද ණය මුදලට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රතිව්‍යුහගත කල රු. 5,147,339 ක්වූ පොළී මුදල ණය මුදලක් ලෙස සලකා සමාලෝචිත වර්ෂයේදී ජ'නල් සටහන් අංක 23 මඟින් දේශීය ණය හා සංවර්ධන අරමුදලට බැර කර සමුච්චිත අරමුදලට හර කර තිබුණි. මේ අනුව එක් එක් වර්ෂ වලදී ණය හිමියන්ට වෙන් කරමින් අදාල වර්ෂ වල වියදමට ගලපා නොගැනීමෙන් සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය එකවර ඉහත වටිනාකමින් අඩුවෙන් දැක්වීමට හේතුවී තිබුණි.

3.2 මතබේදයට තුඩුදුන් ගනුදෙනු
---------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නගර සභාවට අයත් කිරිහල හා භාණ්ඩ සමාලෝචිත වර්ෂය සඳහා බදු දීමට අදාල ටෙන්ඩර් පෝරමයේ ටෙන්ඩර් කොන්දේසි අංක 35 සහ 2015 වර්ෂය වෙනුවෙන් බදුකරු සමඟ ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව කිරි නිෂ්පාදනය සඳහා ප්‍රමුඛතාවය දෙමින් වෙළඳසැල පවත්වා ගතයුතු බව දක්වා තිබියදී කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය නාම පුවරුවට පමණක් සීමා වී තිබූ බවත්, වෙනත් වෙළඳ පරමාර්ථයන්ට මෙම අලෙවිසැල භාවිතා කරන බවත් නිරීක්ෂණය විය.

(ආ) සබරගමුව පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ නගර සභාව සමඟ කිරි නිෂ්පාදන අලෙවිය සඳහා ලබා දී තිබූ භාණ්ඩ වෙනුවෙන් ගිවිසුමක් ඇතිකර ගෙන තිබූ නමුත් එම වෙළඳසැල පවත්වාගෙන නොයෑම නිසා මෙම භාණ්ඩ නැවත එම දෙපාර්තමේන්තුව මඟින් පවරා ගෙන තිබුණි. මේ අනුව පවරාගත් භාණ්ඩ සඳහා මසකට රු. 2,000 ක් බදු මුදල් අඩුකර රු. 60,310 ක් ලෙස මාසික කුලී මුදල් ගෙවීමට බදුකරුට අවසර ලබා දී තිබුණි.

3.3 නිෂ්ක්‍රිය/ ඌන උපයෝජිත වත්කම්
--------------------------------------

රාජ්‍ය පරිපාලන හා පළාත් සභා අමාත්‍යාංශය මඟින් ලබාදී ඇති අංක WP ZA – 5296 දරන මෝටර් ග්‍රේඩරය සහ අංක WP ZA – 5222 දරන බැකෝ ලෝඩරය වර්තමානය වනවිට එම යන්ත්‍ර ක්‍රියාකිරීම සඳහා සේවකයෙකු නොමැති බැවින් සභා පරිශ්‍රයේ නිශ්කාර්යයව ගාල් කර තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය
----------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභා ශාලාව සහ සභාපති කාමරය වායු සමනය කිරීම සඳහා රු. 438,500 ක මුදලක් ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත ගෙවා තිබූ නමුත් එකී සැපයුම් සම්බන්ධයෙන් අදාල භාණ්ඩ වල ගුණත්වය සහ ප්‍රමිතිය පිළිබඳව පරීක්ෂා කර තහවුරු කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර ඒ මඟින් හෝ කාර්මික නිලධාරියෙකු හෝ ඒ පිළිබඳව විශේෂ දැනුමක් සහිත අයෙකු මඟින් නිර්දේශ ලබාගෙන නොතිබුණි.

(ආ) වායු සමන පද්ධතිය ස්ථාපනය කිරීමේදී එම කාමර වල සිසිල් වායුව පිටතට ඇදී නොයන අන්දමින් ඇතුලත වායු සමීකරණ පද්ධතිය බිත්ති වල සවිකල යුතු වුවත්, යන්ත්‍ර 04 ක් ඇතුලත්ව සභා ගර්භය තුල ස්ථාපනය කරන ලද වායු සමන පද්ධතිය ජනෙල් ග්‍රීල් හා පිටත සවිකර ඇති වීදුරු කැබැල්ල පළුදු කර ඒ හරහා වායු සමන බට ඇදීම තුලින් සහ සභා ගර්භයේ පවතින දොරවල් වසා තැබීමට හැකි ආකාරයේ

ස්වයංක්‍රියව දොර වැසීයාමේ උපකරණ සවි නොකිරීමත්, එක් ජනෙල් පියනක් යථා පරිදි වසා තැබීමට නොහැකි වීමත් නිසා සිසිල් වායුව පිටතට ඇදී යන බව නිරීක්ෂණය විය. මේ අනුව වායු සමනය කල කාමර වල යථා පරිදි සිසිලස රඳවා තැබීමට නොහැකි වීමෙන් වායු සමන යන්ත්‍ර වලින් අපේක්ෂිත කාර්යක්ෂමතාවය නොලැබී යාමත්, අනවශ්‍ය පරිදි විදුලිය අපතේ යාමක් සිදුවන බව නිරීක්ෂණය විය.

04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.
------------------------------------------

4.1 අයවැය පාලනය.
-------------------

සමාලෝචිත වර්ෂය තුලදී වැඩසටහන් අංක 04 යටතේ රු. 312,500 ක ආදායම් ඇස්තමේන්තුවක් සහ රු. 327,600 ක වියදම් ඇස්තමේන්තු කර තිබුණද, එම වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය තුලදී කිසිඳු ක්‍රියාකාරකමක් සිදුවී නොතිබුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය
------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම
----------------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි෴

4.5 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්.

----------------------------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ගණනය කල හැකි වටිනාකම වූ රු. 150,000 ක් වන එක් විගණන විමසුමකට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

05. පද්ධති හා පාලනය
-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය